

# නබිතුමාගේ ජීවිතය

السيرة النبوية
باللغة السنهالية

www.islamhouse.com

# السيرة النبوية

( باللغـــة السنهـــــالية)

# නබිතුමාගේ ජීවිතය


المكتب التعاوني للدعوة وتوعية الجاليات بالربوة
ISLAMIC PROPAGATION OFFICE IN RABWAH
P.O.BOX 29465 ARRIYADH 11457
TEL 4454900 – 4916065 FAX 4970126
-e-mail:rabwah@islamhouse.com

# නබිතුමාගේ ජීවිතය

## නබිත්වයට පෙර අරාබිවරුන්

අරාබිවරුන් අතර පිළිම වැඳුම් ප්‍රධාන ආගමක් ලෙස පැවැත්වින. සත්‍ය (ශක්තිමත්) ආගමට එරෙහි පිළිම වැඳුමෙහි යෙදුනු නිසා ඔවුන් ගේ කාලපරිච්ඡේදය " අයියාමුල් ජාහිලියා " (අඥාන කාලය) යනුවෙන් හැඳින් විය. අල්ලාහ් හැර ඔවුන් වැඳුම් කල ප්‍රසිද්ධ පිළිමයන් ලෙස හැඳින්වූයේ අල්ලාත්, අල් උස්සා, මනාත්, හා හුබල් යනාදීන්ය. නමුත් අරාබිවරුන් අතර ක්‍රිස්තියානි හින්දු යුදෙව්වන්ද, ගිනි වැඳුම්කරුවන්ද සිටියහ. තවද, ඔවුන් අතර නබි ඉබ්රාහීම් (අලෙ) තුමාගේ පරිශුද්ධ ආගම පිළිපැදූ පිරිසක්ද වූහ.

ආර්ථික වශයෙන් එහි වාසය කල "බදවි" යනුවෙන් හඳුන්වන ලද ගැමියන් සත්ත්ව

පාලනයෙහි යෙදුනු එඬේරවරුන් ලෙසද, නගර වැසියන්, ව්‍යාපාර හා ගොවිතැන් කරමින්ද ජීවත්වූහ. ඉස්ලාම් ප්‍රසිද්ධවීමට කලකට පෙර සිට මක්කාව අරාබි අර්ධද්වීපයේ ශ්‍රේෂ්ඨ වෙළඳ නගරයක් ලෙස පත්ව තිබිනි. අන් ප්‍රදේශයන් මෙන්ම එහිද ශිෂ්ඨාචාර ජනපදයන්ද දක්නට ලැබිනි.

සමාජයීය අතින් එහි අපරාධයන් පිරී තිබිනි. අසරණයන්ගේ අයිතිවාසිකම් පැහැර හැරීම, හැහැණු දරුවන් (පණපිටින්) වැළලීම, බලවතුන් අසරණයන්ගේ සම්පත් සූරා කෑම, සීමාවෙන් තොරව බහුභාර්ය සේවනයේ යෙදීම, ස්ත්‍රී දූෂණය පැතිරීම හා අල්ප හේතූන් මත ගෝත්‍ර අතර යුද්ධ කිරීම යනාදියෙන් පිරීහී තිබිනි. මෙවැන්නන් ඉස්ලාම් ප්‍රසිද්ධ වීමට පෙර අරාබි අර්ධද්වීපයේ පැවැති නිච සිද්ධීන්ය.

කුරෛෂිවරුන්, නබි මුහම්මද් (සල්) තුමාගේ සීයවූ අබ්දුල් මුත්තලිබ්ගේ ගෝත්‍රය හා ඔහුගේ සම්පත් මුල්කරගෙන ආඩම්බර වෙමින් සිටියහ. අබ්දුල් මුත්තලිබ් දිනක් අල්ලාහ් තමාට පිරිමි දරුවන් දස දෙනෙකු ලබා දෙන්නේ නම්, ඔවුන්ගෙන් කෙනෙක් දෙවියන්ට ලඟාවීම සඳහා බිලිදෙන බවට භාරවිය. ඔහු භාරවූ පරිදි අල්ලාහ් ඔහුට පිරිමි දරුවන් දස දෙනෙකු ලබා දුන්නේය. ඔවුන් අතර මුහම්මද් (සල්) තුමාගේ පියාවූ අබ්දුල්ලාහ්ද කෙනෙකි. තම භාරය ඔප්පු කිරීමට අබ්දුල් මුත්තලිබ් සැරසූවිට මෙය මිනිසාගේ පාරම්පරික කාර්යයක් නොවන බව පවසමින් එය වලක්වාලීමට මිනිස්සු ඉදිරිපත් වූහ. පසුව ඔවුහු ඒ සඳහා වන්දියක් වශයෙන් අබ්දුල්ලාගේ හා ඔටුවන් දස දෙනා අතර කුසපත් ඇදී (තීරණය කිරී) මටද එහිදී අබ්දුල්ලාහ්ගේ නම ඇදෙන්නේනම් ඒ සඳහා ඔටුවන්ගේ සංඛ්‍යාව වැඩි කිරීමටද එකඟ වූහ. ඒ අනුව ඔවුන් කුසපත් ඇදූහ දස වතාවක්ම අබ්දුල්ලාහ්ගේ නම එහිදී

ඉස්මතු විය. පසුව ඒ අනුව ඔවුන් ඔටුවන් සියයක් කපා බිලි දුන්හ.

අබ්දුල් මුත්තලිබ්ට තම පුත්‍රයන් අතර තම සිතින් ඉමහත් ප්‍රිය කරන පුත්‍රයෙකු ලෙස අබ්දුල්ලාහ් පත්වුයේ විශේෂයෙන් මෙම සිද්ධියෙන් පසුවය. අබ්දුල්ලාහ් තරුණ වියට පත්වූවිට අන් මිනිසුට නොවන සේ ඔහුගේ නළලේ (දීප්තිමත්) ආලෝකයක් දිළිසෙන්නට විය. ඔහු වැඩි වියට පත්වූ විට ඔහුගේ පියා බනූ සහ්රා සමාජයෙන් ආමිනා බින්ත් වහබ් (වහබ්ගේ දියණියවූ ආමිනා) යන තරුණිය තෝරා ඔහුට ඇය විවාහ කර දුන්නේය. විවාහයෙන් පසු ඔහුගේ නළලේ දිලිසුන ආලෝකය ආමිනාගේ ඉල ඇට පෙදෙසෙහි දක්නට ලැබිණි. අබ්දුල්ලාහ් තම ජීවිතයේ වැදගත් කාර්‍යයක් ඉටිකලේය. ආමිනා නබිතුමාව ගැබ්වී මාස තුනෙන් පසු අබ්දුල්ලාහ් වෙළඳ කණ්ඩායමක් සමග ෂාම් (සිරියා) නගරය කරා පිටත්විය. ආපසු පැමිණෙන විට අතර මගදී ඔහු අසනීප විය.

මදීනාවේ සිටින තම බනූ නජ්ජාර් ගෝත්‍රයේ මාමාවරුන් වෙත නැවතී සිට එහිදී මරණයට පත්ව එහිදීම භූමිදානය කරන ලද්දේය.

ආමිනාගේ ගැබ් කාලය සම්පූර්ණ වීමෙන් ඇයට ප්‍රසූත වේලාවන්හි අන් ස්ත්‍රීන් ලබන දැඩි වේදනාව හෝ අසීරුතාවය ආමිනාට නොහැඟීන. ක්‍රිස්තු වර්ෂ 570 රබීඋල් අව්වල් මස 12 වැනි සඳුදා දින ෆජ්ර් උදාවීමත් සමගම ආමිනා තම දරුවාව ප්‍රසූත කළාය. මෙම වකවානුව " ආමුල් ෆීල්" ඇත් වසර යනුවෙන් හැඳින්විය.

## ඇත් සටන

අබ්රහා, යනු ඇබිසීනියා රාජ්‍යයේ රජතුමාවූ නජ්ජාසිගේ යෙමන් ප්‍රාන්ත නියෝජිතයාය. අරාබිවරුන් හජ් කර්තව්‍යය සඳහා කඃබාව කරා යාම දුටු මහු, " සන්ආ—ප්‍රදේශයේ විශාල කෝවිලක් ඉදිකර අරාබිවරුන් හජ් කර්තව්‍යය සඳහා මෙම කෝවිලක් කරා හැරවීමට අදහස්

කළේය. මෙය දැනගත් අරාබි ගෝත්‍රයක්වූ " බනූ කිනානා – ගෝත්‍රයේ කෙනෙක් එක් දින රාත්‍රියක් එම කෝවිල තුළට ඇතුළුවී මලමුත්‍රා කර එය අපිරිසිදු කළේය. මෙම පුවත ආරංචි වූ අබ්රහා දැඩි කෝපයට පත්වී කබාව විනාශ කිරීම සඳහා වීරයන් 60,000 කින් සමන්විත සේනාවක් සමග පිටත්විය. ඔහු තමා මේ සඳහා ලොකුම ඇතෙක් තෝරාගත්තේය. එම සේනාවේ ඇතුන් නව දෙනෙක් සිටියහ. ඔහු සේනාව සමග මක්කාවට ආසන්නව ගොස් මක්කා නගරයට පිවිසීමට සූදානම් වූහ. නමුත්, ඇතුන් කඃබා දෙස බලා ගමන් නොකර දණ ගසන්නට විය. ඇතුන් අන් දෙසට හැරවූ සැම විටම පෙරළා දුවන්නටද කඃබා දෙසට හැරවූ විට දණ ගසන්නටද පටන් ගත්හ. ඔවුන් මෙසේ සිටින අවස්ථාවේ අල්ලාහ් අබාබීල් නමැති පක්ෂියන් යැව්වේය. ඒවා ඔවුන් මත පිළිස්සූ ගල් දමන්නට පටන් ගත්හ. එමගින් අල්ලාහ් ඔවුන් අනුභවකළ පිදුරු මෙන් විනාශයට පත් කළේය.

සෑම පක්ෂියක්ම ගල් තුනක් බැගින් රැගෙන ආහ. කොණ්ඩ කඩල ප්‍රමාණය සේ ගලක් හොටයෙන්ද, ගල් කෙක් දෙපාවෙන් රැඳවාගෙනද තිබිත. පුද්ගලයෙකු මත ගලක් වැටෙන්නේද, ඔහු ගේ අවයවයන් කැලිවලට කැඩී බිඳී කොට විනාශවන්නට විය. ඔවුන් පලා යාමට එම ස්ථානයෙන් පිටත් වූහ. මේ නිසා ඔවුහු අසරණ වී කුරුළු පැටියෙකු සේ සත්‍ආවට පැමිණ එහි මරණයට පත්වූහ. කුරෛෂ්වරුන් ගෝත්‍ර වශයෙන් වෙන්වී සේනාවට බියෙන් තමන්ගේ ආරක්ෂාව සඳහා කඳුවලට නැග සිටියහ. සේනාවට සිදුවූ දේ දුටු ඔවුහු වහාම ආරක්ෂවෙන් තම නිවෙස් කරා පැමිණියහ. නබි (සල්) තුමා උපත ලැබීමට දින පනහකට පෙර මෙම සිද්ධිය සිදුවිත.

අරාබිවරුන් තම දරුවන්ගේ ශරීර වර්ධනය සහ පෝෂණය සඳහා ඔවුන්ට තන කිරි දීමට ග්‍රාමීය වැසියන්ගෙන් අවශ්‍යතා ඉල්ලා සිටීම සිරිතක් ලෙස පැවැත්විත. නබි මුහම්මද් (සල්) තුමා ඉපදුනු මෙම

සමයේ බණූ සඅද් ගෝත්‍රයේ පිරිසක් මෙම කාර්යය සඳහා මක්කාවට පැමිණයහ.ඔවුන්ගෙන් ස්ත්‍රීන් මේ සඳහා නිවෙස් සොයමින් සිටිහ. නබි මුහම්මද් (සල්) තුමාගේ අනාථකම හා දිළිඳුකම නිසා පැමිණ ඔවුහු සැම දෙනා එතුමාට (කිරි දීම සඳහා) භාර ගැනීම ප්‍රතික්ෂේප කළහ. ඔවුන් අතර සිටි හලීමතුස් සාදියියා යන කාන්තාවද අන් කතුන් සේ නබිතුමාව ප්‍රතික්ෂෙප කළාය. නමුත් නිවෙස් ගානක් වෙත ඇවිද ගියද තමා සමග ගෙන යාමට දරුවෙක් ඇයට නොලැබීය. එනිසා අඩු කුලියට හෝ එම ආනාථ දරුවා භාරගැනීම සඳහා හලීමා නැවත ආමිනාගේ නිවෙස කරා ගියාය.

හලීමා මක්කාවට තම සැමියා සමග සෙමින් ගමන් කරන අසරණ කෙට්ටු කොටළුවෙක් මත පැමිණියේය. ආපසු යන අවස්ථාවේ නබිතුමා සිය මඩක්කුවේ තබාගෙන ගියේය. සෙමින් ගමන් කරමින් සිටි කොටළුවා වේගයෙන් ගමන්කර අන් සියලු වාහනයන් පසුකර යන්නට විය. යන මගෙහි

(රොත්තපිටින්) ගිය වාහන හිමියන් මේගැන ඉමහත් පුදුමයට පත්වූහ. තවද, හලීමා, තම පියරුවෙන් කිරි අල්පවත් ලෙස හෝ නොඑරීම නිසා තම දරුවන් අධික කුසගින්නෙන් සැමදා අඬවමින් සිටි නමුත් නබි (සල්) තුමාට කිරි පෙවූ පසු තම තනයෙන් කිරි වෙනදාටත් වඩා එරෙන්නටපටන් ගත් බව පැවැසූවාය.

තවද, මෙම දරුවාට කිරි දීමේ විශේෂ භාග්‍ය ලැබීමෙන් බණූ සඅද් ගෝත්‍රයේ වියලී තිබුනූ තමාගේ ඉඩම හා සිව්පාවන් සරුවත්වූ බවද තමාගේ දිළිඳුකම් හා අසරණකම් සියල්ල නැතිවී පොහොසත් වන පරිදි වෙනස්වූ වවද ඇය පැවැසූවාය. නබි තුමා හලීමාගේ රැකවරණයේ වසර දෙකක් ගත කළාය. ඇයද නබිතුමාට විශේෂ සැළකිලි දැක්වූවාය. එතුමාගේ යම් කරුයන් හා එතුමාට සිදුවන අසාමාන්‍ය දේ ගැන හලීමා ගැඹුරෙන් වටහා ගෙන සිටියාය. වසර දෙකකින් පසු හලීමා මක්කාවේ සිටින එතුමාගේ මව හා සීයා වෙත

කැඳවාගෙන ගියේය. නමුත් එතුමාගේ භාග්‍යයෙන් තමාට සිදුවූ විශේෂ වෙනස්වීම් දුටු හලීමා, නබිතුමාව දෙවැනි වරටත් තමාගේ රැකවරණයේ තබාගැනීම සිදහා ආමිනාගෙන් බලවත් ඉල්ලීමක් කළාය. ආමිනා එකඟවිය. හලීමා ඉමහත් ප්‍රීතියෙන් (අනාථ) දරුවා රැගෙන ආපසු බණූසඅද් ගෝත්‍රයේ තම නිවස බලා පැමිණියාය.

## පපුව පැලීම

නබි මුහම්මද් (සල්) තුමාට වයස හතරක් ලඟාවන සමයේදී දිනක් එතුමා තම කිරි සහෝදරයා (හලීමාගේ පුත්‍රයා) සමග කුඩාරමට නුදුරින් සෙල්ලම් කරමින් සිටින අවස්ථාවේ හලීමාගේ පුත්‍රයා දිව ආවේය. ඔහුගේ මුහුණේ ආවේග සළකුණු තිබින. ඔහු තම මවගෙන් තම කුරෙෂ් සහෝදරයා (ට සිදුවූ දේ) බැලීමට පැමිණෙන මෙන් ඉල්ලාසිටියාය. හලීමා සිදුවූ දේ ගැන විමසීය. ඔහු , ඇත්තවශයෙන්ම සුදු ඇඳුම් පැළඳ සිටි දෙදෙනෙකු අප අතර සිටි ඔහු අල්ලා බිමට තබා ඔහුගේ පපුව

පැලීය, යනුවෙන් පවසා එම සිද්ධිය සම්පූර්ණ කිරීමට පෙර හලීමා නබි තුමා කරා වේයෙන් දිවගියාය. එවිට එතුමා එම ස්ථානයේ නොසැලී සිටීමද, එතුමාගේ මුහුණ කහ පාට වීමද, එතුමාගේ ශරීරයේ පාට වෙනස්වී තිබීමද දිටීය. ඇය එතුමාගෙන් සිදුවූ දේ ගැන විමසුවාය. එවිට එතුමා නියත වශයෙන්ම සුදු ඇඳුමෙන් සැරසුනු දෙදනෙක් මාව අල්ලා මාගේ පපුව පැලීය. පසු මාගේ හෘදය පිටට ගෙන එයින් කළු පැහැති දෙයක් ඉවත් කර එය විසි කිරීමෙන් පසු හෘදය ශීතල ජනයෙන් සේදුහ.පසු එය ආපසු ශරීරයතුල තබා පපුව මත පිරිමැදීය. පසු මා සිටි තැන මා හැරදමා මවුන් දෙදෙනා අතුරුදහන් වී ගියහ යනුවෙන් පැවැසීය. හලීමා පපුවේ පැලූ ස්ථානය පිරිමැද බැලුවාය. නමුත් එහි කිසි යම් සළකුණක් ඇයට දක්නට නොලැබීය. පසු මුහම්මදු (සල්) තුමා රැගෙන තම කූඩාරමට පැමිණයාය.

පසු දින උදාවීමෙන් පසු හලීමා මුහම්මදු (සල්) තුමාද රැගෙන මක්කාවේ එතුමාගේ මව වෙත ගෙනගියාය. දරුවා ගැන හලීමාට අධික ඇල්මක් තිබියදීත්, බලාපොරොත්තු නොවූ ආකාරයට හලීමා ආපසු පැමිණීම ගැන ආමිනා මවිතයට පත්වූවාය. එයට හේතුව ආමිනා විමසුවාය. නැවත නැවත කිහිප වරක් විමසීකින් පසු හලීමා පපව පැලීමේ සිද්ධිය පැහැදිලි කළාය.

මදීනාවේ සිටින බණූ නජ්ජාර් ගෝත්‍රයේ තම මාමාවරුන් මූන ගැසීම සඳහා ආමිනා තම යතිම් (අනාථ) දරුවාද රැගෙන පිටත්වූවාය. එහි කලක් ගතකර ආපසු පැමිණෙන අතරමගදී " අබ්වා" යන ස්ථානයේ ඇය අභාවයට පත්වී එහිදීම භූමදානය කරන ලදි. මෙසේ තුමාට තමාගේ සතරවන වියේදී තම මවද අහිමිවිය. පසු එතුමා තම සීයාවූ අබ්දුල් මුත්තලිබ්ගේ රැකවරණයට පත්විය. ඔහු එතුමාට අධික වගකීමෙන් රැකවරණයදී ආදරය කර රැකගෙන සිටියේය.

එතුමාට වයස හයක් සම්පූර්ණවන විට අබ්දුල් මුතලිබ්ද අභාවයට පත්විය. ඉන්පසු දරුවන් කිහිපදෙනෙකුගේ පියකුගෙන් හා අඩු ආර්ථිකයෙන් පසුවන එතුමාගේ ලොකු තාත්තාවූ අබූ තාලිබ් එතුමාට රැකවරණය දුන්නේය. ඔහුද, ඔහුගේ බිරිදද තම දරුවෙකු ලෙස සැළකීහ. යකීම් නබිතුමා තමා ලොකු වියට පත්වන තෙක් ලොකු තාත්තාගේ රැකවරණයේ පසුවිය. මෙම සමයේ නබි තුමාගේ ආරම්භක ජීවිතය පටන් ගත්තේය. එතුමා සත්‍යතාවය හා විශ්වාස වන්තයා යන ගුණාංගයෙන් හැසිරීමෙන් එතුමා එම ගෞරව නාමයෙන් හැඳින් විය. අමීන් (විශ්වාසවන්තයා) පැමිණෙනවා යනුවෙන් පවසන්නේද එය න්බිතුමාගේ පැමිණීම තහවුරු විමකි.

එතුමා යෞවනයෙක්වී වැඩිවියට පත්වීමත් සමග තම ජීවිත හා ආර්ථික කටයුතු සඳහා පෞද්ගලිකව ක්‍රියාකිරීමට අදහස් කළේය. තම කාර්‍යයන් හා ඉපයිමේ ගමන තමා විසින්ම පටන් ගත්තේය.

එනිසා එතුමා සමහර කුරෙයිෂිවරුන්ගේ බැටළුවන් කුලියට රැකබලා ගන්නට විය.

නබිතුමා (ෂාම්) සිරියා දේශය කරා ගමන් කරන වෙළඳ කණ්ඩායමක් සමග ගමන් කළේය. එම ව්‍යාපාරයේ වැඩි කොටසක් අයිතිවූයේ කුවෙයිලිද්ගේ දියණියවූ කදීජාටය. ඇය ධනවත් ස්ත්‍රියෙකි. මෙම වෙළඳ ගමනේ කදීජාගේ භාණ්ඩ සඳහා භාර කාරයා ලෙස ඇයගේ වහලෙක්වූ මෙයිසරා සිටියේය.

නබිතුමාගේ භාග්‍යයෙන් හා නබිවූ කමින් මින් පෙරට වඩා කදීජාගේ වෙළඳාමෙහි අධික ලාභයන් ලැබෙන්නට විය. මෙසේ ලාභ අධිකවීමේ හේතුව පිළිබඳව කදීජා තම වහලෙකු වන මෙයිසරාගෙන් විමසීය. එවිට මෙයිසරා " අබ්දුල්ලාහ්ගේ පුත්‍රයා මුහම්මද් බින් අබ්දුල්ලාහ් වෙළඳ කටයුතුවල යෙදී සිටියේය. ඔහු කරා අධික මිනිසුන් පැමිණිහ. මෙම අධික ලාභය කිසියම් අපරාධයකින් තොරව ලැබින යනුවෙන් කීය. මෙයිසරා කිවූ දේ කදීජා සාවදානයෙන් අසාගෙනසිටියාය. ඇය මීට පෙරද

මුහම්මද් බින් අබ්දුල්ලාහ් ගැන යම් කරුණු දැන සිටියාය. එබැවින් ඇයට එතුමා පිළිබඳව තද ඇල්මක් ඇතිවිය.

කදීජා මීට පෙර විවාහවී ඇයගේ සැමියා අන්තාවූ වැන්දඹු කාන්තාවකි. එනිසා මුහම්මද් (සල්) තුමා සමග විවාහවී නව ජීවිතයෙහි පිවිසීමට ඇය අදහස් කළාය. මේගැන එතුමාගේ කැමැත්ත ලබාගැනීම සඳහා තමාගේ පෑති කාන්තාවක් එතුමා වෙත යැවූවාය. එවිට එතුමා විසිපස් වියට පත්ව සිටියේය. එම කාන්තාව කදීජා විවාහ කිරීම සඳහා එතුමාගේ කැමැත්ත පැතුවාය, එයට එතුමා එකඟවිය. එනිසා විවාහය සිදුවිය ඔවුන් දෙදෙනා භාග්‍ය වන්තයන් වූහ. නබි මුහම්මද් (සල්) තුමා කදීජාගේ දේපළ පිළිබඳ කාර්‍යයන් පාලනය කරන්නට විය. මේ සඳහා තම ශක්තිය හා අවධානය යොමු කළේය. කදීජා අඛණ්ඩව ගැබ්වී දරුවන් ප්‍රසූත කළාය. ඇයට සෛනබ්, රුකයියා, උම්ම කුල්සූම් හා ෆාතිමා යන ගැහැනු දරුවන්ද, කාසිම් හා අබ්දුල්ලාහ් යන

පිරිමි දරුවන්ද සිටියහ. පිරිමි දරුවන් කුඩා අවදියේ අභාවප්‍රාප්ත වූහ.

නබිත්වයට පත්වීම

නබි මුහම්මද් (සල්) තුමා තමාට වයස හතලිහ (40) ලඟාවන අවධියේ මක්කාවට සමීපයෙන් පිහිටා ඇති හිරා නම් වූ කඳු ගුහාවේ තනියමින් හා අසාමාන්‍යයෙන් සිටීමටද එහි රෑ හා දහවල් කාලය ගතකිරීමටද විය. එතුමා හතලිස්වන වියට පත්වූ සමයේ රමලාන් මාසයේ විසි එක්වන (21) දින රාත්‍රි කාලයේ හිරා ගුහාවේ එතුමා සිටි අවස්ථාවේ දේව දූත ජිබ්රීල් (අලෛ) තුමා පැමිණ " පාරායනය කරන්න – යනුවෙන් පැවැසීය. එතුමා " මා පාරායනා කිරීමට නොදනිමි – යනුවෙන් කීහ. මෙසේ ජිබ්රීල් (අලෛ) තුමා දෙවැනි හා තෙවැනි වතාවන්ද පාරායනකරන මෙන් පැවසීය. තෙවැනි වතාවේදී එතුමා නබි තුමාට ....

اقْرَأْ بِاسْمِ رَبِّكَ الَّذِي خَلَقَ (١) خَلَقَ الْإِنسَانَ مِنْ عَلَقٍ
(٢) اقْرَأْ وَرَبُّكَ الْأَكْرَمُ (٣) الَّذِي عَلَّمَ بِالْقَلَمِ (٤) عَلَّمَ
الْإِنسَانَ مَا لَمْ يَعْلَمْ (٥)

සියළු දේ මැවූ ඔබ දෙවියාගේ නාමයෙන් පාරායනා කරනු, ඔහු අලක් යන ස්ථාවරයේ සිට මිනිසා මැව්වේය. පාරායනා කරනු, ඔබගේ දෙවියා මහත් ධානවන්තයෙකි. ඔහු පත්හිඳ මගින් මිනිසාට නොදන්නා සැමදේ ඉගෙන්නුවේය. (96:1−5) යනුවෙන් (පාරායනා කරන මෙන්) පැවැසීය. පසු එතුමා එතැන් සිට ආපසු පිටත්ව ගියේය. මුහම්මද් (සල්) තුමාට එහි රැඳී සිටීමට නොහැකි විය. එනිසා වෙව්ලන සිතින් තම නිවෙසට හැරී කදීජා වෙතට පැමිණ මාව පොරවන්න, යනුවෙන් පැවසීය. බිය යන තෙක් එතුමාව පොරවා තැබුවේය. එතුමා තමාට සිදුවූ දේ ගැන කදීජාට පැහැදිලිකර තමා

තම ජීවිතය ගැනද බියවන බව පැවැසීය. එවිට කදීජා "එසේ නොව, අල්ලාහ් මත දිවුරා කියමි අල්ලාහ් ඔබතුමාට කිසි දිනක නින්දා නොකරන්නේය. නියතවශයෙන්ම ඔබතුමා ඥාතීන් සමග එක්ව සිටින්නේය අසීරුතාවයන් ඉවසන්නේය, නැති බැරි අයට උපයා දෙන්නේය. අමුත්තන්ට සළකන්නේය. යථාර්තයෙන් දුෂකරතාවයට ලක්වූවන්ට උපකාර කරන්නේය.

දින කීපයකින් පසුව එතුමා ඇඳහීම අඛණ්ඩව කරගෙන යෑම සඳහා හා රමලාන් මාසයේ ඉතිරි දිනයන් සම්පූර්ණ කිරීම සඳහා හිරා ගුහාව කරා නැවත ගියේය. එම මාසය අවසන් වූ විට මක්කාව යාම සඳහා හිරාවේ සිට බැසීය. " බතනුල් වාදී – නමැති ස්ථානය ලඟාවූ විට දේවදූත ජිබ්රීල් (අලෙ) තුමා අහස හා පොලොව අතර සිංහාසනයක මත අසුන් ගනිමින් නබිතුමා වෙත පැමිණිය. පසු පහත සඳහන් අල්ලාහ්ගේ වැකිය පහළ විය.

يا أيها المدثر، قم فأنذر، وربك فكبر، وثيابك فطهر، والرجز فاهجر

(පොරෝනයකින්) පොරවමින් සිටින්නානෙණි ඔබ නැගිට මිනිසුන්ට) අවවාදකරනු, තවද ඔබ දෙවියාව ආඩම්බර කරනු, තවද ඔබ ඇඳුම් පැළඳුම් පවිත්‍රව තබා ගනු. තවද අපවිත්‍රකම පිළිකුල් කරනු. ) (74:2-5) පසුව අඛණ්ඩව අල්ලාහ්ගේ එහි (පණිවුඩය) පහළවිය.

නබි මුහම්මද් (සල්) තුමා තම කැඳවීම ආරම්භ කළ විගස එම විශ්වාසනීය කැඳවීම එතුමාගේ ශ්‍රේෂ්ඨ වූ බිරිඳ පිළිගත් අතර, ඇය අල්ලාහ් තආලාගේ ඒකත්වය හා තම ගෞරවණීය සැමියාගේ නබිත්වය සඳහා සාක්ෂි දැරීය. ඇය ප්‍රථමයෙන් ඉස්ලාමය වැළඳගත් තැනැත්තිය වූවාය. තම මව හා සීයාගෙන් පසු තමාට ර‍ැකවරණය දී තමාව ඇතිකළ ලොකු තාත්තා අබූ තාලිබ්ට ප්‍රති උපකාරයක් කිරීම සඳහා නබිතුමා ඔහුගේ

පුත්‍රයෙක්වූ අලි තුමා යටතේ රැඳවා ගෙන තම රැකවරණයේ ඇතිකිරීමටත්, මහු වෙනුවෙන් වියදම් කරන්නටත් විය. මෙම සමයේ අලීද සිත් පැහැදිලිවී විශ්වාස කලේය. පසු කදීජාග් වහලෙක් වූ සෙයිද් බින් හාරිදාද මවුන් සේ විශ්වාස කලේය. නබි (සල්) තුමා තම හිත මිත්‍රයාවූ අබූබක්ර් (රලි) තුමාට මේ ගැන දැන් විය. මහු කිසිදු කලබලයෙකින් තොරව විශ්වාස කර සත්‍ය කලේය. කැඳවීමේ කාර්‍යය රහසිගතව පැවැතිය. රහසිගතව යනුවෙන් හැඳින්වන්නේ නබිතුමාගේ මිත්‍රයන්, එතුමා පිලිපදින්නන් හා එතුමාගේ කැඳවීමෙන් ඉස්ලාමය වැළඳගන්නන් රහසිගතව රැස්වන ස්ථානයේ කැඳවීමකි. නියත වශයෙන්ම අධික පිරිස් එතුමා විශ්වාස කලහ. නමුත් ඔවුහු තම ඉස්ලාමය ගැන බිය වන්නට වූහ. මක්නිසාදයත්, මවුන්ගෙන් කෙනෙකුගේ කාර්‍ය ප්‍රසිද්ධ වෙන්නේද මහු ඉස්ලාමයෙන් පිටමන් කිරීම සඳහා කුරෛෂ්

කාෆිර්වරුනගේ විවිධාකාර හිරිහැර හා වේදනාවන්ට මුහුණ දීමට සිදු වූ නිසාය.

**ප්‍රසිද්ධ කැඳවීම**

නබි මුහම්මද් (සල්) තුමා වසර තුනක කාලයක් පෞද්ගලික කැඳවීමෙහි යෙදීමෙන් පසු අල්ලාහ්

فَاصْدَعْ بِمَا تُؤْمَرُ وَأَعْرِضْ عَنِ الْمُشْرِكِينَ (٩٤)

එබැවින් ඔබට අණකර ඇති දේ ඔවුන්ට ප්‍රසිද්ධියෙන් පවසනු. (වැඳුම් පිදුම්හි) හවුල් කරන්නන් ප්‍රතික්ෂේප කරනු. (15:94) යන වැකිය පහළ කළේය.

දිනක් නබි මුහම්මද් (සල්) තුමා සෆා කඳුවේ සිට කුරෙෂ් වරුන් කැඳවීය. එහි විශාල පිරිසක් රැස්වූහ. ඔවුන අතර අල්ලාහ්ට හා ඔහුගේ දූතයාවූ නබිතුමාට කුරෙෂිවරුන් අතර තද හතුරා වූ තම ලොකු තාත්තා අබූ ජහ්ල්ද පැමිණ සිටියේය. රැස්ව සිටින කුරෙෂිවරුන් අමතා නබිතුමා " මෙම කන්දට පිටු පස ඔබලා විනාශ කිරීමේ

අපේක්ෂාවෙන් විරෝදීන් රැඳී සිටින බව මා පවස්නේනම් එය ඔබලා පිළිගන්නේද? යනුවෙන් ඔවුන්ගෙන් ඇසීය. ඔවුහු " අප ඔබගේ සත්‍යතාවය හා විශ්වාසය හැර අන්කිසි දෙයක් නොදිටින්නෙමු. යනුවෙන් කීහ. පසුව නබිතුමා ඔබලාට දැඩි වේදනාවන් ඇති බව මා අවවාද කරමි. යනුවෙන් පවසා ඔවුන් අතර ඇති පිළිම වැඳුම් අතහැර (වැඳුම් පිදුම් සඳහා) අල්ලාහ් තආලා කරා කැඳවීමට ආරම්භ කළේය. ජනතාව අතර සිටි අබූලහබ් වහාම නැගිට " ඔබට විනාශය ඇතිවේවා ! මේ සඳහාද අපිව රැස්කලේ" යනුවෙන් පැවැසීය. එවිට අල්ලාහ් තආලා මෙසද් නමැත් පහත සිදහන් (කුර්ආන්) පරිච්ඡේදය පහළ කළේය.

تَبَّتْ يَدَا أبِي لَهَبٍ وَتَبَّ * ما أغنى عنه ماله وما كسب، سيصلى نارا ذات لهب، وامرأته حمالة الحطب، في جيدها حبل من مسد * ( المسد ١ ٥)

අබූලහබ්ගේ දැත් විනාශ වේවා. ඔහුද විනාශ වේවා ඔහුගේ දේපල හා ඔහු ඉපැයූ දේද ඔහුට පලක්

නොවේවා! ඔහු සීඝ්‍රයෙන් දැල්වෙන ගින්නෙහි පිවිසේ. තවද දර උසුලන ඔහුගේ බිරිඳද ගින්නෙහි පිවිසේ. ඇයගේ බෙල්ලෙහි ඇඹරුණු ඉඳි ලණු දමා තිබේ. (111:1-5)

නබිතුමා කැඳවීමේ කටයුතුහි නිරතව සිටි අතර, මිනිසුන් රැස්වන ස්ථානවල එය ප්‍රසිද්ධ කිරීමටද ඔවුන් ඉස්ලාම් කරා කැඳවීමටද පටන් ගත්තේය. කඃබාවහි එතුමා නැමදුම ඉටු කළේය. මුස්ලිම්වරුන්ට කාෆිර්වරුන්ගේ හිරිහැර අධිකවිය. යසිර්, (ඔහුගේ බිරිඳ) සුමෙයියා හා ඔවුන්ගේ පුත්‍රයා අම්මාර් යන්නන්ට සිදුවූ දේ නිදසුනකි. ඔහුගේ දෙමාපියන් ෂහීද්වරුන් (පරිත්‍යාග ශීලීන්) සේ දිවි පිදූහ. සුමෙයියා ඉස්ලාම් වෙනුවෙන් ප්‍රථමයෙන් දිවි පිදූ කාන්තාවකි. මෙය සිදුවූයේ ඉස්ලාමය වැළඳගත් හේතුව නිසාය. තවද, බිලාල් බින් රිබාහ් අල් හබෂි (රලි) සුමයියා බින් ගලෆ් හා අබූජහ්ල් යන අයගේ වෙදනාවට ලක්විය.

බිලාල් (රලි) අබූබක්ර් (රලි) තුමා මාර්ගයෙන් ඉස්ලාම් ධර්මය වැළඳ ගත්තේය. මහුගේ හාම්පුතාවූ උමයියා බින් ගලෆ් මේ බව දැනගත් විගස ඉස්ලාම් ධර්මය අත හැරීම සඳහා විවිධ ආකාරයෙන් වේදනාවට ලක් කළේය. නමුත් බිලාල් (රලි) මහුගේ ඉල්ලීම් ප්‍රතික්ෂේප කොට ඉස්ලාමය ස්ථිරව වැළඳ ගත්තේය. උමයියා මහුව අල්ලා දම්වැලින් බැඳ මක්කා සීමාවෙන් පිට ගෙනවිත් දැඩි උෂ්ණයෙන් යුත් වැලි (ගොඩ) මත තබා, මහුගේ පපුව මත ලොකු ගලක් තබා මහුද මහුගේ යහලුවන්ද කෲර ලෙස කසයෙන් පහර දුන්හ. නමුත් බිලාල් අහද් අහද් (අල්ලාහ් කෙනෙකි, අල්ලාහ් කෙනෙකි) මෙන් පවසමින් සිටියේය. මෙම අවස්ථාවේ අබූබක්ර් (රලි) තුමා එතැනින් පසුකර යන්නට විය. එබැවින් අබූබක්ර් උමයියාගෙන් මහුව මිළදී ගෙන අල්ලාහ්ගේ මාර්ගයෙහි නිදහස් කළේය.

මෙවැනි අපරාධ සිදුවීම් වැළක්වීමේ උපායන් වශයෙන් නබි තුමා ඔවුන්ගේ ඉස්ලාමය ප්‍රසිද්ධ කිරීම තහනම් කළේය.

## ඇබිසීනියාවට හිජ්රත් යාම

තම ඉස්ලාමය එළිකරන මුස්ලිම්වරුන්ට විශේෂයෙන්, ඔවුන්ගෙන් අසරණයන්ට මුෂ්රික්වරුන් නොකඩවා හිරිහැර කරමින් සිටියදී, අබිසීනියාවේ නජ්ජාෂි රජතුමා වෙත ඔහුගේ රැකවරණය පතා පලායන ලෙස නබි මුහම්මද් (සල්) තුමා තම අනුගාමිකයන්ගෙන් ඉල්ලා සිටියේය. මුස්ලිම් වරුන්ගෙන් වැඩි පිරිසක් තමන්ට හා තම පවුලේ අයට කුරෙෂිවරුන් ගැන (හිරිහැර කළේදැයි) බියට පත්ව සිටිහ. මෙය සිදු වූයේ නබිත්වයෙන් පසු පස්වැනි වසරේ දිය. එනිසා මුස්ලිම්වරුන් 70 දෙනෙක් පමණ තම පවුල් සමග පලා යාමට පිටත්වූහ. ඔවුන් අතර උස්මාන් බින් අෆ්වාන් (රලි)

ද එහුගේ බිරිඳවන නබිතුමාගේ දියණියවූ රුකයියාද සිටියහ.

මුස්ලිම්වරුන් අබිසීනියාවේ නැවතීම වළක්වාලීමට කුරෛෂ් වරුන් කුමන්ත්‍රණය කළහ.

කුරෛෂිවරන් අබිසීනියාවේ රජතුමාට තෑගි බෝග ප්‍රධානය කරමින් පලාගිය මෙම අය තමන් අවනට භාරදෙන මෙන් ඉල්ලීමක් කළ අතර, මොවුන් රසා නබිතුමාට හා එතුමාගේ මවට බැණ දොස් පවරන බවද රජතුමාට දැනුම් දුන්හ. මේ ගැන නජ්ජාෂි මවුන්ගෙන් විමසීය. මවුහු ඉස්ලාම් ධර්මයේ රසා නබිතුමා ගැන පවසන කරුණු හා සත්‍යය මහුට පැහැදිලි කළහ. එහෙයින් මහු මවුන් ආරක්ෂා කළේය. මවුන් කුරෛෂිවරුන්ට භාරදීම ප්‍රතික්ෂේප කළේය.

මෙම වසරේ දිනක් නබිතුමා කඃබා (හරම් ෂරීෆ්) වෙත ගියේය. එහි අධික කුරෛෂිවරුන් රැස්ව සිටියහ. නබිතුමා මවුන් අතර සිට බලාපොරොත්තු නොවන පරිදි (සූරතුන් නජ්ම්) යන පරිච්ඡේදය

පාරායනා කිරීමට පටන් ගත්තේය. මෙම කිපිර්වරුන් මින් පෙර අල්ලාහ්ගේ වැකියන් නොඅසා සිටිහ. කුමක් නිසාදයත්, මවුන් නබි මුහම්මද් (සල්) තුමාගෙන් කිසිවෙක් කන්දි නොඇසීමට මවුහු අතර ගිවිසගෙන සිටිහ. නමුත් මෙම කුර්ආන් පිරිච්ඡේදය පාරායනා කළවිට ආකර්ශණීය මෙම දේව වැකියන්ට මවුන් ශ්‍රවණය කළහ. මවුන් සැම දෙනා තම නෙත් යොමා එය සවන්දීමට වූහ මවුන්ගේ සිතෙහි එය හැර අන්කිසි දෙයක් නොහැඟීය. මුහම්මද් (සල්) තුමා "අල්ලාහ්ට සුජූද් (හිසනැමීම්) කරන්න. මහුටම වැඳුම් පිදුම් කරන්න. යන වැකිය නෙක් පාරායනා කර හිස නැමී සුජූද් කළේය. මවුන් කිසි කෙනෙකුට සිත් මෙල්ල නොවී මවුන්ද සුජූද් කරන්නට වූහ. මෙහි සහභාගි නොවූ මුෂ්රික්වරුන් සැම මාර්ගයෙන්ම සුජූද් කළ අයට දෝශා රෝපනය කළහ. මෙම අවස්ථාවේ මවුන් නබිතුමා ගැන අසත්‍යයන් කතා කළහ. මවුන් නබිතුමා තමන්ගේ පිළිමයන් ප්‍රශංසා

කළ බවද එම පිළිමයන්ගේ නිර්දේශයන් පිළිගැනෙන බව එතුමා පැවැසූ බවද කීහ. මුවහු සුජූද් කළ අය එයින් වළක්වාලීම සඳහා මෙසේ දෝශාරෝපනය කළහ.

## උමර් (රළි) ඉස්ලාමය වැළඳ ගැනීම

උමර් බින් කත්තාබ් (රළි) තුමා ඉස්ලාම් ධර්මය වැළඳ ගැනීම මුස්ලිම්වරුන්ට උපකාරයක් ලෙස පැවැතිය. නබි මුහම්මද් (සල්) තුමා මුහුට ෆාරූක් යනුවෙන් නම් කළේය. කුමක් නිසාදයත්, අල්ලාහ් තආලා මුහු විසින් සත්‍යය හා අසත්‍යය වෙන් කළේය. ඉස්ලාම් ධර්මය වැළඳ දින කීපයෙන් පසු දිනක් උමර් (රළි) නබිතුමාගෙන්, නබිතුමණි, අපි සත්‍යයේ නොසිටින්නේද යනුවෙන් ඇසිය. එයට නබි තුමා එසේ නොවේ අපි සත්‍යයේම සිටින්නෙමු, යනුවෙන් පැවැසිය. එසේනම් ඇයි අපි මෙය සගවා සිටින්නෙමු යනුවෙන් පැවැසිය උමර් (රළි) නැවැත ඇසීය. මුහම්මද් (සල්) තුමා අර්කම්

(රලි) ගේ නිවසේ තමා සමග සිටි මුස්ලිම්වරුන් ගෙන් හම්සා බින් අබ්දුල් මුත්තලිබ් යටතේ පිරිසක්ද, උමර් බින් කත්තාබ් යටතේ පිරිසක්ද වන පරිදි කොටස්කර, ඔවුන් සමග කැඳවීම් මාර්ගයේ තම ශක්තිය උපුටා පෙන්නුම් කිරීම හා එම කැඳවීම ප්‍රසිද්ධ කිරීම සඳහා මක්කා මාර්ගයන් කරා පිටත්විය.

කැඳවීමේ කටයුත්ත හෙළාදැකීමේ කාර්‍යයෙහි කුරෛෂිවරුන් විවිධ ක්‍රමයන් උපයෝගී කළහ. චරිතඝාතන, අක්‍රමිකතාවන්, අපරාධයන් හා අභූත චෝදනාවන් එල්ල කළහ. නමුත් මේ සියල්ල ඔවුන් ඉස්ලාම් ධර්මයේ නිරතවීමට හා මුස්ලිම්වරුන් අධිකවීමට හේතුවිය. මෙම අවස්ථාවේ ඔවුහු නව ක්‍රියා මාර්ගයක් සඳහා සැළසුම් කළහ. මුස්ලිම්වරුන් හා බණූ හාෂිම්වරුන් සමග සම්බන්ධතාවයන් සහමුලින්ම අත්හිටුවිය යුතුයි, මුස්ලිම්වරුන් සමග වෙළඳ කටයුතුවල යෙදීම්, විවාහ කිරීම, උපකාර කිරීම හා ආශ්‍රය කිරීම

යනාදියන් නොපැවැත්වය යුතුයි. යනවෙන් පත්‍රයක ලියා එහි සැම දෙනාම අත්සන් කර එය කඃබා බිත්තියේ එල්ලා ප්‍රදර්ශන සඳහා තැබූහ. මුස්ලිම්වරුන් මක්කාවෙන් පිටත්ව ෂිඅබු අබූතාලිබ් යන ප්‍රපාතය කරා යැමට සිදුවිය. එහිද මුස්ලිම්වරුන් දුෂ්කර වේදනාවන්ට ලක්වූහ. කුස ගින්නටද, අධික පීඩනයටද ඔවුන්ට මුහුණ පෑමට සිදුවිය. ඔවුන්ගෙන් ශක්තිවන්තයන් තම සම්පත්වලින් වියදම් කළහ. ඔවුන් අතර රෝග පැතිරිය පිරිසක් මෙමගින් මරණයට පත්වූහ. නමුත් ඔවුන් ස්ථිරයෙන් හා ඉවසීමෙන් සිටියහ ඔවුන්ගෙන් කිසියම් කෙනෙක් හෝ ආගම අතරහැර නොගියහ. මෙසේම වසර තුනක් පීඩනයෙන් ගත කළහ.

පසු බණු හාෂිම්වරුන් සමග කිට්ටුම නෑකම් පවත්වන කුරෛෂ්වරුන්ගෙන් වැදගත් පිරිසක් පත්‍රයෙහි කරුණු නිශ්චල කරිමටද ඒ බව ජනතාවට දැනුම් දිමටද ඉදිරිපත්වූහ. එම පත්‍රය (කඃබා බිත්තියෙන් ගලවා) පිට රැගෙන ආ විට

එහි " බිස්මක අල්ලාහුම්ම " අල්ලාහ්ගේ නාමයෙන් ආරම්භ කරමි" යන සුළු කොටස හැර අන් සියල්ල වේයන් විසින් විනාශකර ඇති බව පෙණිනි. මෙම අවහිරයන් අවසන් වීමෙන් පසු මුස්ලිම්වරුන් හා බණු හාෂිම්වරුන් මක්කාවට ආපසු පැමිණියහ. නමුත් කුරෛෂ්වරුන් මුස්ලිම්වරුන්ට විරුද්ධවීමේ ස්ථාවරයේ නිරතව සිටියහ.

## ශෝක වසර

අබුතාලිබ්ගේ ශරීරය පුරාම රෝගය පැතිරෙන්නට විට. ඔහු ගිලන් ඇඳෙහි නිරතවන්නට විය. ඔහු මරණ (සක්රාත්) වේදනාවට ලක්වී සිටි අතර, මිය යාමට පෙර ඔහු "ලාඉලාහ ඉල්ලල්ලාහ්" (වැඳුම් පිදුම් කිරීමට සුදුස්සා අලලාහ් හැර අන් කිසිවෙකු නොමැත) යන වැකිය කීමේ අපේක්ෂාවෙන් නබි මුහම්මදූ (සල්) තුමා ඔහුගේ සිරස අසලෙහි සිටියේය. නමුත් ඔහු සමග සිටින ඔහුගේ අයහපත් මිත්‍රයන් හා ඔවුන්ගේ නායකයාවූ අබූජහල්ද එය

වළක්වමින් හා " මගේ පියානන්ගේ හා මුතුන් මිත්න්ගගේ ආගම අත් නොහරිනු යනුවෙන් මහුට පවසමින් සිටීහ. එනිසා මහු මිර්කයේම (අල්ලාහ්ට හවුල් කරන මාර්ගයෙහි) අන්තාවිය. මහු ඉස්ලාම් ධර්මය නොවැළඳ මණයට පත්විම නබි මුහම්මදු (සල්) තුමාගේ ශෝකය දෙගුණයක් වීමට හේතුවිය අබූතාලිබ් අන්තාවිය. මහු ඉස්ලාම් ධර්මය නොවැළඳ මරණයට පත්වීම නබි මුහම්මදු (සල්) තුමාගේ ශෝකය දෙගුණයක් වීමට හේතුවිය. අබූතාලිබ් අන්තා වී මාස දෙකක් ලගාවූ සමයේ නබිතුමාගේ බිරිඳවූ කදීජා (රලි) තුමියද අන්තාවිය. මේ හේතුවෙන් නබි තුමා ඉමහත් ශෝකයට පත්විය. තම ලොකු පියාවූ අබූතාලිබ්ගේ හා තම බිරිඳවූ කදීජා (රලි) තුමියගේ වියෝවෙන් පසු නබි තුමාට තම සමාජයෙන් හිරිහැර හා පීඩාවන් අධිකවන්නට විය. (මෙම මරණ සිදුවීමෙන් නබි මුහම්මදු (සල්) තුමා අධික ශෝකයට පත්වූ බැවින් මෙම වසර ආමුල් හුස්න් (ශෝක වසර) යනුවෙන් හැදින්විය.

## තායිෆ් ගමන

මුස්ලිම්වරුන්ට කුරෙෂ්වරුන්ගේ හිරිහැරයන්, අක්‍රමිකතාවන්, අපරාධයන්, හා නින්දාවන් නොකඩවා සිදුවින, කුරෙෂ්වරුන් යහ මගට යොමු කිරීම පිළිබඳව නබිතුමා වෙහෙසට පත්ව සිටියේය. තායිෆ් වැසියන්ට අල්ලාහ් යහමග පෙන්විය හැක යනුවෙන් තායිෆ් ප්‍රදේශය ගැන නබිතුමා සිතන්නට විය. තායිෆ් කරා ගමන් කිරීම අපහසු කරුණකි. මක්නිසාදයත්, තායිෆ් නගරයට යන මග වටා විශාල කඳු තිබීම නිසා එම මගෙහි ගමන් කිරීම දුෂ්කර කාර්‍යයෙකි. නමුත් අල්ලාහ්ගේ මාර්ගයෙහි සියල්ල පහසුවිය හැක. එනමුත් තායිෆ් වැසියන් එතුමා පහත් අන්දමින් නින්දාකර පලා එවූහ. ඔවුන් කුඩා ළමයින් උසිගැන්වූහ. ඔවුන් නබිතුමාගේ විළුම දෙකෙහිම රුධිරය එනතෙක් ගල් ගැසූහ.

එනිසා නබිතුමා මේ සියල්ල ඉවසාගෙන අධික ශෝකයට පත්වී මක්කාව කරා ආපසු

පැමිණෙන්නට විය. මෙම අවස්ථාවේ දේවදූත ජිබ්රීල් (අලෛ) තුමා කඳු සඳහා නියමවූ මලක් (දේවදූත) වරයා සමග පැමිණ නබිතුමාට අමතා "ඔබ කැමැති දේ අණ කිරීම සඳහා අල්ලාහ් තආලා ඔබ වෙත කඳු සඳහා නියමවූ මලක්වරයා එවා ඇත. යනුවෙන් පැවැසීය. එවිට කඳු සඳහා නියමවූ මලක්වරයා " මුහම්මද් තුමණි ඔබ කැමැති වන්නේනම්, මක්කාව වටකර ඇති මෙම (මක්කාව පිරිවරා ඇති ) කඳු දෙක මගින් මා ඔවුන් විනාශ කරන්නම්. යනුවෙන් නබිතුමා අමතා පැවැසීය. එවිට නබිතුමා " නමුත් අල්ලාහ් තආලා ඔවුන් මගින් ෂිර්ක් (හවුල්) නොකර, එකම අල්ලාහ්ට වැඳුම් පිදුම් කරන පරම් පරාවක් බිහි කිරීමට මා අපේක්ෂා කරමි යනුවෙන් පැවැසීය.

මුෂ්රික්වරුන් නබිතුමාගෙන් අශ්චර්‍යය ක්‍රියාවන් පෙන්වනමෙන් තර්ක කරමින් සිටියා පමණක් නොව, එය වරින්වරද අසන්නට වූහ. වරක් ඔවුන් චන්ද්‍රයා දෙකට පළා පෙන්වන මෙන් ඉල්ලා සිටිහ.

නබිතුමා මේ ගැන අල්ලාහ්ගෙන් ඇසීය. එවිට ඔවුන් චන්ද්‍රයා දෙකට පැලී තිබීම දිටීහ. කුරෙයිෂිවරුන් මෙම ආශ්චර්‍යය සිද්ධිය දීර්ඝ වේලාවක් නරඹමින් සිටි නමුත් ඔවුන් විශ්වාස නොකළහ. එනමුත් ඔවුන් " මුහම්මදු අපට හූණියම් (ගුරුකම්) කළේය. යනුවෙන් කීහ. එවිට පුද්ගලයෙක් " ඔහු ඔබලාට හූණියම් කළාට මිනිසුන් සැම දෙනාට හූණියම් කිරීමට ඔහුට ශක්තියක් නොමැත. එනිසා ( වෙළඳ කටයුතු සඳහා පැමිණෙන) මගීන්ගෙන් විමසා බලන්න. යනුවෙන් කීවේය. එවිට මගීන් පැමිණියහ. ඔවුන්ගෙන් මේ ගැන විමසූහ ඔවුහු " එසේ මයි. නියතවශයෙන්ම අපිද එය දුටුවෙමු. යනුවෙන් පැවැසූහ. නමුත් කුරෙෂ්වරුන් ( මෙය දැන සිටි අතර,) ඔවුන්ගේ කුෆ්ර් (ප්‍රතික්ෂේප කිරීම) හි හිතුවක්කාරකමින් නිරතව සිටීහ. මෙම හඳ පැලීමේ සිද්ධිය මීට වඩා ඉමහත් ආශ්චර්‍යය සිද්ධියක්

සඳහා පසුබිමක් විය. එය අල් ඉස්රා හා අල් මිඃරාජ් යනුවෙන් හැඳින්වේ.

## ඉස්රා හා මිඃරාජ්

නබි මුහම්මද් (සල්) තුමා තායිෆ් සිට ආපසු පැමිණීමෙන් පසු එහිදී එතුමාට සිදුවූ ඛේදය, අබූතාලිබ් හා කදීජා (රලි) අන්තාවීමද, එයින් පසු සිදුවූ කුරෛෂ්වරුන්ගේ දුෂ්කර හිරිහැරයන්ද නබි තුමාගේ සිතෙහි අධිකශෝකයන් ඇති කළේය. එම අවස්ථාවේ නබිතුමාට අල්ලාහ් තආලාගේ සැනසුම ලැබෙන්නට විය.

නබිත්වයේ දසවන වසර රජබ් මස විසිහත්වන දින රාත්‍රියේ, නබි (සල්) තුමා නින්දෙහි පසුවෙමින් සිටියේදී දෙව් දූත ජිබ්රීල් අලෛ තුමා "බුරාක්ද රැගෙන නබිතුමා වෙත පැමිණිය. බුරාක් යනු අකුණක් සේ වේගයෙන් ගමන් කරන පිහාටු දෙකකින් යුත් අශ්වයාට සමාන සතෙකි. එය මත

නබි (සල්) තුමා එහි අසුනෙහි රැඳවාගෙන පලස්තීනයේ පිහිටා ඇති බයිතුල් මුක්අද්දස් නමැති දේවස්ථානය වෙත පැමිණේය. පසු එතැන් සිට එතුමා අහසට (මිඃරාජ්හි) ඔසවාගෙන ගෙන යන ලදි. එහි එතුමා නම දෙවියාගේ මහා සාධකයන්(ආධාරයන්) දිටීය. අහසේදී පස්වෙල නැමදුම එතුමාට අනිවාර්ය විය. එම රාත්‍රියේම නබි මුහම්මද් (සල්) තුමා පැහැදිලි සිහින් හා දැඩි ස්ථිරයෙන් මක්කාව කරා පැමිණිය.

පසු දින එළිවීමත් සමගම නබිතුමා කඃබාවට ගොස් තමාට සිදුවූ දේ ගැන මිනිසුන්ට පැහැදිලි කළේය. එවිට කාෆිර්වරුන් එතුමාව අසත්‍ය කිරීමටත් විහිළු කිරීමටත් පටන් ගත්හ. පසු එහි සිටි පිරිසක් එතුමාව අධෛර්‍යමත් කිරීම සඳහා බයිතුල් මුකද්දිස් දේවස්ථානය ගැන තමන්ට වර්ණනා කරන මෙන් එතුමාගෙන් ඇසීය. නබිතුමා ඔවුන්ට ඒ ගැන මදක් වර්ණනා කරන්නට විය. මෙයින මුෂ්රික්වරුන් සෑහීමට පත් නොවූහ. නමුත් ඔවුන් " අපිට

වෙනත් සාධකයන් අවශ්‍යයයි—යනුවෙන් කිහ. එබැවින් නබි මුහම්මද් (සල්) තුමා, මක්කා දිසාවෙන් පැමිණෙන කණ්ඩායමක් අතර මගදී තමාට මූණ ගැසුනු බව පවසා ඔවුන්ගේ ලක්ෂණයන්ද ඔවුන් සතු ඔටුවන් ගේ සංඛ්‍යාවද ඔවුන් පැමිණි වේලාවද පැහැදිලි කළේය. නබි තුමා සත්‍ය පැවැසුවද කාෆිර්වරුන් එතුමාව ප්‍රතික්ෂේප කිරීමෙහිද, මුරණ්ඩු කිරීමෙහිද, සත්‍ය නොකිරීමෙහිද නිරත වූහ. මෙම (ඉස්රා) ගමන ගියදා උදේ දේව දූත ජිබ්රීල් (අලෙ) තුමා පැමිණ නබි මුහම්මද් (සල්) තුමාට පස්වේල සලාතය (නැමදුම) ඉටුකිරීමේ ක්‍රමය හා එහි වේලාවන් ගැන ඉගෙන්විය. මින් පෙර සලාතය උදේ හා සවස රකඅත් දෙකක් බැගින් පමණක් තිබින.

කුරෛෂ්වරුන් සත්‍යටය විරුද්ධවීමෙහි නිරතවී සිටි සමයේ නබි මුහම්මද් (සල්) තුමා මක්කාවට පැමිණෙන මිනිසුන්ට කැඳවීම් කිරීමේ කාර්යයෙහි යෙදී සටියේය. එතුමා මිනිසුන්ට ගමනේදී හා ඔවුන්

නැවැතී සිටින ස්ථානවලදී ඉස්ලාම් ධර්මය ගෙනහැර දක්වා එය පැහැදිලි කරන්නට විය.

එතුමාගේ ලොකු පියෙකු වන අබූ ලහබ්ද එතුමා යන තැන් කරා ගොස් එතුමා ගැනද එතුමාගේ කැඳවීම් ගැනද මිනිසුන්ට අවවාද කරමින් සිටියේය. වරක් එතුමා මදීනාවේ සිට පැමිණි පිරිසට කැඳවීම් කළේය. ඔවුහු එය සාවදානයෙන් අසා සිට එතුමා පිළිගැනීමටත් එතුමා විශ්වාස කිරීමටත් එකඟවූහ. මදීනා වැසියන් ඉතා සමීපයෙන් නබි වරයෙකු පැමිණෙන බව යහූදි (යුදෙව්) වරුන්ගෙන් දැන සිටිහ. එනිසා නබිතුමා ඔවුන්ට කැඳවීම් කළ විගස නබිතුමා මෙතුමා බව හඳුනා ගෙන ඉස්ලාමය වැළඳ ගැනීමට කඩිනම් වූහ. ඔවුන් මෙම කාර්‍යයෙහි යහූදිවරුන් තමන්ට වඩා ඉදිරියට නොයා යුතුයි යනුවෙන් කීහ. ඔවුන් හය දෙනෙකි. දෙවන වසරේ දොළොස් දෙනෙක් පැමිණ නබිතුමා වෙත රැස්වූහ. එතුමා ඔවුන්ට ඉස්ලාම් ධර්මය ඉගැන්විය. ඔවුහු මදීනාවට ආපසු යන විට කුර්ආනය ඔවුනට ඉගැන්වීම සඳහා හා ඉස්ලාම් ධර්මයේ නීති රීති

පැහැදිළි කිරීම සඳහා මුස්අබ් බින් උමෛර් යන අය ඔවුන් සමග යැව්වේය. මදීනා වැසියන් අතර ප්‍රයෝජනයක් ඇති කිරීමට මුස්අබ් බින් උමෛර්ට හැකිවිය. ඔහු වසරකින් පසු මක්කාවට ආපසු පැමිණවිට ඔහු සමග මදීනා වැසියනගෙන් පිරිමින් හැත්තැවක්ද ස්ත්‍රීන් දෙදෙනෙක්ද සිටියහ. නබි මුහම්මදු (සල්) තුමා ඔවුන් රැස්කළේය. ඔවුහු නබිතුමාගේ (ඉස්ලාම්) ධර්මයට උපකාර කරනබවටද, එතුමාගේ අණ පිළිපදින බවටද එතුමා සමග ගිවිස ගත්හ. පසු ඔවුහු මදීනාව කරා ආපසු පිටත්ව ගියහ.

## කැඳවීමේ නව මූලස්ථානය

මදීනාව සත්‍යතාවයටද, සත්‍යවන්තයන්ටද රැකවරණය හා අභය ලබාදෙන ස්ථානයක් වශයෙන් පරිවර්තනය විය. එනිසා මුස්ලිම්වරුන් මදීනාව කරා හිජ්රත් (සංක්‍රමනය) යාමට පටන් ගත්හ. නමුත් කුරෛෂිවරුන්, මුස්ලිම්වරුන් හිජ්රත් යාම වලක්වාලීමට අධිෂ්ඨානය කළහ. එනිසා

සමහර මුහාජිර්වරුන්ට (හිජ්රත් යන්නන්ට විවිධ වේදනා හා හිරිහැරයන් කරන්නට වූහ. මුසලිම්වරුන් කුරෙෂ්වරුන්ට බියවී රහසිගතව හිජ්රත් යන්නට විය. උමර් (රලි) තුමාගේ හිජ්රත් ගමන වීරකමට හා අභියෝගයට සාදාකයක් වශයෙන් පැවැතිය. එතුමා තම කඩුව පැළඳ, දුන්න ඔසවා කඃබාව කරා පිටත්ව එහි සක්මන් (වටකිරීම) කළේය. පසු ඔහු මුෂ්රික් වරුන්ගෙන් කවරෙකු තම බිරිඳ වැන්දඹු කිරීමට හෝ තම දරුවා අනාථ කිරීමට කැමැතිවන්නේද ඔහු මා කරා පැමිණෙන්න. මා හිජ්රත් යන්නෙමි, යනුවෙන් අභියෝග කරමින් පිටත්විය. එතුමාගේ ගමන වළක් වාලිමට ඔවුන් කිසි කෙනෙකුට ධෛර්‍යය නොවීය. අබූබක්ර් (රලි) තුමා හිජ්රත් යාම සඳහා නබිතුමාගේ අවසරය පැතිය. එවිට නබිතුමා " ඔබ ඉක්මන් නොවන්න, ඔබට අල්ලාහ් සහයෙක් ලබාදීමට හැක, යනුවෙන් අබූබක්ර් (රලි) තුමාට

පැවැසීය. මෙසේ අධික මුස්ලිම්වරුන් හිජ්රත් ගියහ. මෙය දුටු කුරෛෂි වරුන් කුපිත වූහ. නබිතුමාගේ කාර්යයෙහි ශ්‍රේෂ්ඨතම හා එතුමාගේ කැඳවීම ගැන ඔවුන් බියට පත්වූහ. එනිසා ඔවුහු මේ ගැන සාකච්ඡා කර නබිතුමා මරා දැමීමට ඒකමතිකව තීරණය කළහ. අබූ ජහ්ල් " අපගේ සෑම ගෝත්‍රයෙකින්ම ශක්තිමත් තරුණයෙකු බැගින් තෝරා ඔවුන් අතට කඩු දී, ඔවුන් මුහම්මද්ව වටකර,එක් මිනිසෙක් කැපූ සේ (සෑම දෙන එකට) කැපිය යුතුයි යනුවෙන් මා අපේක්ෂා කරමි. එවිට එම වරද්ද සෑම ගෝත්‍රයන්ටම හිමිවේ. ඊට පසු, මිනිසුන් සියලු දෙනාටම විරුද්ධවීමට බනූ හාෂිම් වරුන් ශක්තිය නොලබති, යනුවෙන් පැවැසීය. මෙම රහස් තීරණය ගැන අල්ලාහ් තම ශ්‍රේෂ්ඨ නබිතුමාට දැන්වීය. එනිසා නබිතුමා අබූබක්ර් (රලි) තුමා සමග හිජ්රත් යාමට තීරණය කළහ. තමා, තම නිවසෙහි සිටින බව මිනිසුන් සිතීම සඳහා එදින රාත්‍රියේ තම ස්ථානයේ නිදා

ගන්නා ලෙස අලී බින් අබී තාලිබ් (රලි) ගෙන් නබිතුමා ඉල්ලා සිටියේය. මහුට කිසියම් අවහිරයන් නොසිදුවන බවද දැන්විය.

කුමන්ත්‍රණකාරයන් පැමිණ නිවෙස වටකරමින් සිට, ඇතිරිල්ලෙහි සිටි අලි (රලි) තුමා දකිමින් එය නබිතුමා බව සිතූහ, එනිසා මවුන් තම තීරණය ඉටුකර එතුමා මරා දැමීම සඳහා නබිතුමා පිටවෙනතෙක් බලාපොරොත්තුවෙන් සිටීහ. මවුන වටකර සිටිද්දී නබිතුමා එවුන්ගේ හිස මත පස් ටිකක් ඉසිඳ පිටත්විය. අල්ලාහ් මවුන්ගේ පෙනීම ඉවත් කළේය. එනිසා මවුහු නබිතුමා පිටතවීම නොදිටීහ. නබිතුමා අබූබක්ර් (රලි) තුමා සොයා ගියේය. පසු එතුමන් දෙදෙනා සැතපුම් පහක දුරක් ගමන්කර කවර් ගුහාවෙහි සැඟවී සිටියහ.

කුරෙෂ් තරුණයන් ඉර උදාවන තෙක් එතුමා පිටත්වීම බලා පොරොත්තුවෙන් සිටීහ. ඉර උදාවීමෙන් පසු නබිතුමාගේ අතිරිල්ලෙහි සිටි අලි (රලි) තුමා නැගිටමින් පැමිණියේය. මහු මවුන්ගේ

අතට අහුවිය. නබි(සල්) තුමා ගැන මවුහු එතුමාගෙන් විමසූහ. මහු නබිතුමා ගැන කිසිවක් නොපැවැසීය. එනිසා මහුට පහර දෙමින් ඇදගෙන හියහ. නමුත් එයින් කිසිදු පලක් නොලැබින. පසු කුරෛෂිවරුන් සැම තැන්හි එතුමාව සෙවීම සඳහා කණ්ඩායමක් සූදානම් කළේය. කවරෙකු හෝ එතුමාව පණපිටින් හෝ ජීවිතක්ෂයට පත්කර ගෙනෙන්නේද මහුට ඔටුවන් සීයයක් දෙන බව පැවැසීහ. මෙසේ මවුන් නබිතුමා සොයාගෙන ගුහා දොරටුවටම ලඟාවූහ. නබි (සල්) තුමා රැඳි සිටි ස්ථානයටම ලඟා වූහ. නබිතුමා පිළිබඳව අබුබක්ර් (රලි) තුමාගේ දුක අධිකවිය. එනිසා නබිතුමා අබූබක්ර් (රලි) තුමාට " අපි දෙන්නෙක් සිටින බවද මබ සිතන්නේ මෙහි තෙවැන්නා ලෙස අල්ලාහ් සිටී, මබ කණගාටු නොවන්න. නියත වශයෙන්ම අල්ලාහ් අප සමග සිටින්නේය. යනුවෙන් කිය. නමුත් මවුහු මෙම දෙනා නොදිටිහ. මෙම ගුහාවෙහි දිනතුනක් රැඳී සිට මදීනාව කරා

පිටත්වූහ. එය දීර්ඝ මාර්ගයෙකි. ඉරෙහි උෂ්ණයද අධික ලෙස පැවැතිය. දෙවැනි දින සවස් වරුවේ කුඩාරමක් අසලට ළඟාවූහ. එහි උම්මු මඃබද් යනුවෙන් හඳුන්වන කාන්තාවක් දුටුහ. ඇයගෙන් ආහාර පානයන් ඉල්ලා සිටීහ. අසරණවූ කෙටවූ, කිරි බිංදුවක් හෝ නොමැත් එළුවෙක් හැර වෙන කිසිවක් ඔවුන් නොදිටීහ. එහෙයින් නබිතුමා එළුවා ළඟට ගොස් කිරි බුරුල්ල අතින් පිරිමැද කිරි දොවන්නට විය. එයින් ලොකු භාජනයකට කිරි පුරවන්නට විය. එය දුටු උම්මු මාබද් පුදුමයටපත්ව සිටියේය. පසු පිපාසයෙන්මිදෙන තෙක් ඔවුන් සැමදෙනා එය පානය කළහ. පසු නබිතුමා දෙවන වරත් කිරි දොවා භාජනය පුරවා එය උම්මු මඃබද්ට භාරදී තම ගමන ආරම්භ කළේය.

මදීනා වැසියන් මුහම්මද් (සල්) තුමාගේ පැමිණීම අපේක්ෂා කරමින් සියහ. ඔවුන් සැමදා මදීනාවේ පිටසිට එතුමාගේ පැමිණීම බලාපොරොත්තුවූහ. නබිතුමා මදීනාවට පිවිසි දින ඔවුන සතුටින්

ප්‍රශංසාකර පිළිගත්හ. එතුමා මදීනාවෙ සාතුවෙ පිහිටි කුබා යන ස්ථානයේ බැසීය. එහි දින හතරක් රැඳී සිට ඉස්ලාමීහි ප්‍රථම දේවස්ථානය වන මස්ජිදුල් කුබා දේවස්තානයට එහිදී අත්තිවාරම් තැබීය. පස්වන දින මදීනාවට ගියේය. අන්සාර්වරුන් (උපකාර කළ මදීනා වැසියන්) අධික පිරිස් නබිතුමා කැඳවා ගෙන යාමටද, තමන්ගේ නිවසෙහි එතුමාට ආගන්තුක සංග්‍රහය කර එමගින් ගෞරවය ලැබීමටද ආශා කළහ. එනිසා ඔවුහු ඔටුවාගේ කඩිවාලම අල්ලා ගත්හ. නබිතුමා ඔවන්ට ස්තුති පුද කරමින් " මෙය අත හරින්න, නියත වශයෙන්ම මෙය අල්ලාහ්ගේ අණට කීකරුවේ. යනුවෙන් පැවැසීය. අල්ලාහ් අණ කළ ස්ථානයකරා ගොස් එය දණගැසීය. පසු එය නැගිට මදක් ඇවිදිමෙන් පසු ආපසු පැමිණ පළමු ස්ථානයෙහි දණ ගැසීය. මේ දක්වා නොබැස සටි නබිතුමා මෙහිදී බැසගත්හ. මෙම ස්ථානය මස්ජිදුන් නබවි දේවස්ථානයට අයත් ස්ථානය විය. නබි තුමා අබූ

අයියූබ් අල් අන්සාරීගේ නිවසෙහි ලැගුම් ගත්තේය. අලි බින් අබූතාලිම් නබිතුමාගේන් පසු දින තුනක් මක්කාවෙහි රැඳී සටි මදීනාව කරා පිටත්ව කබා යන ස්ථානයේ නබිතුමා සමග එක්විය.

## මදීනාවේ නබිතුමා

නබි මුහම්මද් (සල්) තුමා මටුවා දණගැසූ ස්ථානය එහි අයිතිකරුගෙන් මිළදීගෙන එහි නම මස්ජිදය (දේවස්තථානය) ඉදි කළහ. මුහාජිරීන් ( එතුමා සමග මක්කා සිට පැමිණි (මිත්‍රයන් ) හා අන්සාරීන් ( උපකාර කළ මදීනා වැසියන්) අතර සහෝදරත්වය ඇති කළහ. සෑම අන්සාර්වරුන්ටම එක් මුහාජිර්වරයෙකු බැගින් සහෝදරවරයෙකු වශයෙන් පවරා ඔවුන්ගේ සම්පත්වලට එක් සිත්ව කටයුතු කරන්නට පටන් ගත්හ. සහෝදරත්යට ඔවුන් අතර අධිකවන්ට විය.

කුරෙයිෂිවරුන්ට මදීනා යහූදිවරුන් (යුදෙව්වන්) සමග සම්බන්ධතාවයන් පැවැත්වින. එනිසා ඔවුන් මුස්ලිම්වරුන් අතර ප්‍රශ්ණ හා භේද ඇතිකිරීමට තැත් කළහ. තවද ඔවුන් මුස්ලිම්වරුන්ට අවවාද කරමින්ද, ඔවුන් විනාශකරන බවට තර්ජන කරමින්ද සිටියහ. මෙසේ භාහිරවශයෙන් හා අභ්‍යන්තර වශයෙන් මුස්ලිම්වරුන්ට අනතුරු තත්ත්වයක් දක්නට ලැබිණි. සහාබිවරුන් (නබිතුමාගේ අනුගාමිකයන්) ආයුධයෙන් තොරව රාත්‍රී කාලය ගත නොකරන තරමට විරුද්ධ වාදීන්ගේ විරුද්ධතා උග්‍රවිය. මෙම භයානක සමයේ අල්ලාහ් තආලා යුද්ධ කිරීමේ අවසරය පහළ කළේය. එනිසා නබිතුමා විරුද්ධවාදීන්ගේ ගැවසීම ඔත්තු බැලීම සඳහා සේනාවක් පිළියෙළ කළේය. එසේම ඔවුන් මුස්ලිම්වරුන් සමග ගිවිසුමක් ඇතිකර නිදහසේ ඉස්ලාම් ධර්මය ප්‍රචාරය කිරීමටද ඒ අනුව ක්‍රියා කිරීමටද කටයුතු සලස්වන තෙක්. මුසලිම්වරුන්ගේ ශක්තිය පෙන්වීම මගින් ඔවුන්ට

තම බලය කහවුරු කිරීම සඳහා වෙළඳ ගෝත්‍රයන්ට මගෙහි අවහිර කිරීමට සූදානම් කළේය. මේ වනවිට නබිතුමා විසින් සමහර ගෝත්‍රයන් අතර සුහද ගිවිසුම්ද ඇති කර තිබිනි.

## බද්ර් යුද්ධය

නබි මුහමමද් (සල්) තුමා කුරෙෂි වරුන්ගේ වෙළඳ කණ්ඩායමක් මගෙහි බාධා කිරීමට තීරණය කළේය. එනිසා එතුමා මිනිසුන් 313 දෙනෙක් සමග පිටත්විය. ඔවුන් සමග අශ්වයන් දෙන්නෙක් හා ඔටුවන් 70 දෙනෙක් පමණක් සතු විය. කුරෙෂවරුන්ගේ කණ්ඩායමේ ඔටුවන් 1000 කින් සමන්විත විය. මේ සම්බන්ධයෙන් අබූ සුෆ්යාන් මේ පිළිබඳව මක්කාවට පණිවිඩයක් යවා ඔවුන්ගෙන් උදව් පැතීය. ඔහු තම ගමන් මාර්ගය වෙනස් කරමින් වෙනත් මාර්ගයකින් ගමන් කළ බැවින් මුස්ලිම්වරුනගේ අපේක්ෂාව නොඉටුවිය. කුරෙෂිවරුන් 1000 කින් සමන්තවිත සේනාවකින් ආහ. එවිට අබූ සුෆ්යාන්ගේ දූතයා ඇවිත් වෙළඳ

කණ්ඩායම මුස්ලිම්වරුන්ගේ බාධකයෙන් මිදී (ජයපිට) පැමිණෙන බවත්, මක්කාව බලා ආපසු යන ලෙසත් ඉල්ලා සිටියේය. නමුත් අබූජහ්ල් ආපසු යාම ප්‍රතික්ෂේප කළේය. ඔවුන්ගේ සේනාව බදර් කරා යන්නට විය. කුරෛෂි වරුන්ගේ පිටවීම දැනගත් නබිතුමා තම අනුගාමිකයන් සමග සාකච්ඡා කළේය. ඔවන් සැමදෙනා කාෆිර්වරුනගේ සේනාවට මුහුනදී යුද්ධකිරීමට එකග වූහ.

හිජ්රි දෙවැනි වසරේ රමලාන් මස 17 වෙනි සිකුරාදා දින උදේ දෙපිරිසම මුන ගැසින. ඔවුන් අතර යුද්ධය උග්‍රව පැවැත්විය. මුස්ලිම්වරුන්ට ජය ලැබීමත් සමගම යුද්ධය අවසන්විය. මුස්ලිම්වරුන් 14 දෙනෙක් දිවි පුද කළහ. මුෂ්රික්වරුන් 70 දෙනෙක් මරණයට පත්වූ අතර 70 දෙනෙක් අත් අඩංගුවට ගනු ලැබින. මෙම යුද්ධය පැවැති අවස්ථාවේ නබිතුමාගේ දියණියෙක්වන උස්මාන් බින් අෆ්වාන් (රලි) තුමා ගේ බිරිඳවූ රුකයියා (රලි) තුමිය (මදිනාවේදී ) අභාවයට පත්විය. අසනීපයෙන්

පෙළෙන තම බිරිඳ සමග මදිනාවේ රැඳී සිටින මෙන් නබිතුමා කළ ඉල්ලීම අනුව මෙම යුද්ධයට සහභාගි නොවී උස්මාන් (රලි) තුමා තම බිරිඳ සමග මදිනාවේ නැවැතී සිටියේය. යුද්ධයෙන් පසු නබිතුමා උම්මු කුල්සූම් (රලි) නමැති තම දෙවැනි දියණිය උස්මාන් (රලි) තුමාට විවාහකරන දුන්නේය. මෙනිසා එතුමා " දුන්නූරෙන් " (ආලෝකයන් දෙකක් සතු තනැත්තා) යනුවෙන් හැඳින්විය. කුමක් නිසාදයත් මහු නබි තුමාගේ දියණියන් දෙදෙනෙක් විවාහ කළ නිසාය.

බද්ර් යුද්ධයෙන් පසු මුස්ලිම්වරුන් අල්ලාහ්ගේ උපකාරයෙන් සතුට විඳිමින් මදිනාව කරා ආපසු පැමිණියහ. මවුන් සමග සිර කරුවන්ද ගනීමත් (යුද්ධයේදී අතහැර ගිය) යුධ උපකරණ වෙනත් ද්‍රව්‍යයන්ද තිබින. සමහර සිරකරුවන් ඇපය මත නිදහස් වූහ. සමහරුන් ඇප වන්දි කිසිවක් නොමැතිව නිදහස් වූහ. සමහරුන් (උගතුන්) මුස්ලිම් දරුවන් දස දෙනාට කියවීමට හා ලියවීමට ඉගැන්වීමේ ඇපය මත නිදහස්වූහ.

## උහද් යුද්ධය

බද්ර් යුද්ධයෙන් පසු මුස්ලිම්වරුන් හා මක්කාවේ කාෆිර් වරුන් අතර වෙනත් යුද්ධ කීපයක්ද සිදුවිය මෙයින් උහද් යුද්ධය දෙවැනි යුද්ධයෙකි. මෙම යුද්ධයේදී මුස්ලිම්වරුන් නබි තුමාගේ අණට කීකරු නොවූ නිසාත් ඔවුන්ට නියමකළ කාර්‍යයන්හි එවුන් වැරදි කළ නිසාත් මුෂ්රික්වරුන්ට ජය ලැබිනි. මෙම යුද්ධය සඳහා මක්කා වැසියන් **3000** කින් සමන්විත යුද්ධ සේනාවක් පිටත්විය. මුස්ලිම්වරුන් **700** ක් පමණ සිටියහ. මෙම යුද්ධයෙන් පසු යහූදීන් පිරිසක් මක්කාවට ගොස් මදීනා මුස්ලිම්වරුන් සමග යුද්ධ කිරීමට ඔවුන් දිරිගැන්වූහ. ඔවුන් උදව් උපකාර කරන බවටද පොරොන්දු වූහ. ඔවුන්ද එය පිළිගත්හ. පසු වෙනත් ගෝත්‍රයන්ද මුස්ලිම්වරුන්ට එරෙහිව යුද්ධ කිරීමට ඔවුන් දිරිගැන්වූහ. ඔවුන්ද එසේම එකඟවූහ. එනිසා මුෂ්රික්වරුන් 10.000 කින්

සමන්විත කණ්ඩායමක් සමග සෑම පළාත්හි සිට මදීනා කරා පැමිණියහ.

නබි (සල්) තුමා විරෝදීන්ගේ ගැවසීම දැනගත් විගසම තම අනුගාමිකයන් සමග සාකච්ඡා කළේය, එම සාකච්ඡාවේදී මදීනා වටේම කඳු නැති තැන්වල අගල් කැපීම පිළබඳ යෝජනාවක් සල්මානුල් ෆාරිස් (රලි) යන සහාබිවරයා ඉදිරිපත් කළේය. ඒ අනුව කඩිනමින් අවසන් කිරීම සඳහා සෑම මුස්ලිම්වරුන්ම අගල් කැපීමේ කාර්යයට සහභාගී වූහ. මුෂ්රික්වරුන් මෙම අගල් පසු කර යාමට නොහැකිව මසකට ආසන්න කාලයක් රැඳී සිටියහ. පසු අල්ලාහ් කිපිර්වරුන් කරා තද සුළගක් එව්වේය. එමගින් ඔවුන්ගේ කූඩාරම් සියල්ල ගැලවී විනාශ විය. ඔවුන් බියට පත්වී සීඝ්‍රයෙන් තම තමන්ගේ ගම්බිම් බලා ආපසු යන්නට වූහ.

## මක්කා ජය ගැනීම

නබි මුහම්මදු (සල්) තුමා හිජ්රි අටවැනි වසරේ මක්කා වැසියන් සමග යුද්දකර මක්කාව

ජයගැනීමට තීරණය කළේය. එතුමා රමලාන් මස දසවැනි දින 10.000 කින් යුතු සේනාවක් සමග පිටත්ව, කිසියම් යුද්ධයකින් තොරව මක්කාව තුලට පිවිසීය. කුරෛෂිවරුන් යටහත් වූහ. අල්ලාහ් මුස්ලිම්වරුන්ට උපකාර කළේය. නබිතුමා මස්ජිදුල් හරාම් දෙවස්ථානය කරා ගියේය. එහි කඃබාව සක්මන් කර එහිතුල රකඅත් දෙකකින් සමන්විත සලාතයන් ඉටුකළේය. ඉන්පසු කඃබා තුල හා උඩහි තිබී සැම පිළිමයන් කඩා විනාශ කළ පසු නබිතුමා කඃබාවේ දොරටුවෙහි රැඳී සිටියහ.

කුරෛෂිවරුන් මස්ජිදුල් හරාම් හි පෙළගැසී සිටගෙන තමන්ට කුමක් කරයිදැයි බලා සිටියහ. එවිට නබිතුමා " කුරෛෂවරුනි ඔබලාට කුමක් කරමි ද යනුවෙන් සිතන්නේද? යනුවෙන් ඇසීය. ඔවුහු " ඔබ යහපත් දේ කරන්නාය. ඔබ ගෞරවණීය සහෝදරයාය. ගෞරවණීය සහෝදරයාගේ පුත්‍රයාය. යනුවෙන් කීහ. පසුව නබිතුමා ඔබලාට නිදහස ලැබුණා යනුවෙන් පැවැසූහ. මුහම්මද්

නබිතුමා තමන්ට වේදනාකළ, තම අනුගාමිකයන් මරණයට පත්කළ, තමාට හිරිහැර කළ හා තමන්ව තම උපන්ගමෙන් පිටමනකළ විරෝධීන්ට සමාව දීමෙන් උසස් ආදර්ශයක් පෙන්වා දුන්නේය. මක්කා ජය ගැනීමෙන් පසු අල්ලාහ්ගේ ධර්මය කරා මිනිසුන් කණ්ඩායම් වශයෙන් පිවිසෙන්නට වූහ. හිජ්රි දෙවැනි වසරේ නබි (සල්) තුමා හජ් මෙහෙය ඉටුකළේය. එය එතුමා ඉටු කළ පළමු සහ අවසාන හජ් මෙහෙයයි. එතුමා සමග ලක්ෂයකට අධික පිරිසක් හජ් කර්තව්‍යය ඉටුකළහ. හජ් කර්තව්‍යය ඉටු කලායින් පසු නබිතුමා මදීනාවට පැමිණායේය.

## නබිතුමාගේ අභාවය

හජ් කර්තව්‍යය ඉටුකර පැමිණ මාස දෙකහමාරකින් පසු නබිතුමා අසනීපයට පත්විය. එය දිනෙන් දින අධිකවන්නට විය. මිනිසුන්ට සලාතය ඉමාමත් (නායකත්වයක් යටතේ) ඉටු කිරීමට නොහැකිවූ එතුමා ඉමාමත් කරන මෙන්

අබූබක්ර් සිද්දීක් (රලි) තුමාගෙන් ඉල්ලා සිටියේය. හිජ්රි එකළොස් වැනි වසර රබී උල් අව්වල් මස දොළොස් වැනි සඳුදා දින නබි මුහම්මදු (සල්) තුමා අභාවප්‍රාප්ත විය. එවිට එතුමාට වසර 63ක් සම්පූර්ණවී තිබින.

මෙම පණිවිඩය සහාබි (අනුගාමික) වරුන් ලද විගස ඔවුන්ගේ සිහි බුද්ධිය විකල් විය. ඔවුන්ට එය අදහා ගැනීමට නොහැකිවිය එවිට අබූ බක්ර් (රලි) තුමා නැගිට ඔවුන් සැනැසුම්කර " නියත වශයෙන්ම නබිතුමා මනුෂ්‍යයෙකි. මිනිසුන් මැරෙන සේ එතුමාද මරණයට පත් විය. — යනුවෙන් පැවැසීය. මිනිසුන් සැනසුම් වූහ. නබි තුමාගේ දේහය දෝවනය කර කෆන් වස්ත්‍රයෙන් ආවරණය) කර භූමදානය කිරීමේ කටයුතු සියල්ල අවසන්විය.

නබි (සල්) තුමාගේ අභාවයෙන් පසු මුස්ලිම්වරුන් අබූබක්ර් සිද්දීක් (රලි) තුමාව මුස්ලිම්වරුන්ගේ කලීෆා (නායකයා) ලෙස තෝරා පත් කළහ.

එතුමා කුලෆාඋර් රාෂිදීන්වරුන් (යහමග ගිය නායකයන්) අතර පළමුවන්නාය. නබිතුමා මක්කාවේ නබිත්වයට පෙර හතලිස් වසරක්ද, නබිත්වයට පසු දහතුන් වසරක්ද, මදීනාවේ දස වසරක්ද ජීවත්විය.

## නබිතුමාගේ ගුණාංග

මුහම්මද් (සල්) තුමා මිනිසුන් අතර ඉමහත් විරවන්තායා ලෙස සිටියහ. අලී බින් අබූතාලිබ් (රලි) තුමා " උග්‍ර යුද්ධයේ යෙදී සිටියදී හා දෙපිරිස් අතර මුහුණට මුහුණ ලා යුද්ධ කරද්දී අපි නබි (සල්) තුමා මගින් ආරක්ෂාවෙමු" යනුවෙන්පවසන්නේය. නබි (සල්) තුමා මගින් අපේක්ෂා වෙමු. යනුවෙන් පවසන්නේය. නබි (සල්) තුමා මිනිසුන් අතර ඉමහත් පරිත්‍යාගශීලී වන්තයෙක් වශයෙන් සිටියේය. එතුමාගෙන් කිසියම් දෙයක් අයැද සිටින්නේද එය නොමැති බව එතුමා

නොපවසන්නේය. එතුමා තමා වෙනුවෙන් කිසියම් කෙනෙකු ගෙන් පළිගැනීමද කෝපවීමද නොකළේය. නමුත් අල්ලාහ්ගේ ගෞරවයන් උදාසීන කරන අවස්ථාවන්හිදී පමණක් එතුමා අල්ලාහ් වෙනුනේ තදින් ක්‍රියාත්මක වූහ. සත්‍යවශයෙන්ම තමන්ගේ අයද, අන් අයද, බලවතාද හා අසරණයාද එතුමා ඉදිරියේ එක සමානය. යමෙකු අන් කෙනෙකුට වඩා අල්ලාහ් පිළිබඳ බිය භක්තියෙන් (තක්වා) තොරව ශ්‍රේෂ්ඨවන්තාය නොවන බව එතුමා තහවුරුව කළේය. නියත වශයෙන්ම සෑම මනුෂ්‍යයන්ම සමානවන්තයන්ය. පැරණි සමාජයන් විනාශවූයේ ඔවුන් බලවතා සොරකම් කළේද එය නොසලකා සිටීම හා අසරණයා සොරකම් කළේද ඔහුට අඩුවම් ලබාදිම යන හේතු නිසාය. නබිතුමා මෙසේද පැවසූහ. " අල්ලාහ් මත දිවුරා තියමි, මුහම්මදුගේ දියණියවූ ෆාතිමා සොරකම් කළේද නිශ්චයෙන්ම ඇයගේ අත කපන්නේමි යනුවෙන් පැවැසීය.

නබි මුහම්මද් (සල්) තුමා කිසියම් ආහාරයක් සම්බන්ධයෙන් විවේචනය නොකළේය. කැමැති නම්, එය අනුභව කළේය. අකැමැති වුවද, එය අනුභවකිරීමෙන් වැළකී සිටියේය. නබිතුමාගේ පවුලේ අය තම නිවසෙහි ලිප නොදැල්වා මාසයක් හා දෙමාසයක් ගත කළහ. රට ඉඳි හා ජලය මවුන්ගේ ආහාරය විය. නබිතුමා කුස ගින්න නිසා තම කුසෙහි ගල්ද බැඳ සිටියේය. එතුමා තම පාවහන් මසා ගතතේය. ඇඳුම්හි අණ්ඩ දමා ගත්තේය. ගෘහස්ත කටයුතුවලදී තම බිරිඳට සහාය දැක්විය. රෝගීන්ගේ සුවදුක් විමසීම් කළේය. එතුමා මිනිසුන් අතර ඉමහත් කීකරු වන්නායාය. පොහොසතාද දිළින්දාද උසස්වන්නයාද පහත්වන්නයාද හෝ වේවා භෝජන සංග්‍රහය සඳහා ආරාධනා කළේද එය එතුමා පිළිගත්තේය එතුමා දුප්පතුන් (මිස්කීන්වරුන්) ප්‍රිය කළේය. මවුන්ගේ ජනාසාවලට සහභාගිවිය, මවුන් අතර සිටි රෝගීනගේ සුවදුක් විමසීය. දිළින්දෙකු මහුගේ

දිළිඳුකම නිසා නින්දා නොකළේය. රජු කෙනෙකුට මහුගේ රජකම නිසා බිය නොවීය. එතුමා අශ්වයා, ඔටුවා, බූරුවා හා කොටළුවා මත ගමන් බිමන් කළේය.

නබි මුහම්මද් (සල්) තුමා අධික කලබලයටද ශෝකයටද පත් වුවද මිනිසුන් අතර මද සිනහවෙන් හා යහපත් ශීලයෙන් සිටියහ. එතුමා මිහිරි සුවඳවත් දෑ ප්‍රිය කළේය. දුගඳ දේ පිළිකුල් කළේය. අල්ලාහ් එතුමාට සම්පූර්ණ ගුණාංගයන් හා කුසල් ක්‍රියාවන් එකතු කළේය. තවද, අල්ලාහ් එතුමාට පෙරවිසූවන්ට හා පසුව පැවැතෙන්නන්හට නොදුන් දැනුම (ඥාණයන්) ලබා දුන්නේය. එතුමා කියවීමට හා ලිවීමට නොහැකි සමාන්‍ය කෙනෙකි. මිනිසුන් උදෙසා අල්ලාහ්ගෙන් මෙම කුර්ආනය එතුමා වෙත පහළ විය. එම කුර්ආනයේ අල්ලාහ් තආලා මෙසේ පවසන්නේය.

( قل لئن اجتمعت الإنس والجن على أن يأتوا بمثل هذا
القرآن لا يأتون بمثله ولو كان بعضهم لبعض ظهيرا)

මෙම කුර්ආනය සේ එකක් නිර්මානය කිරීම සඳහා මිනිස් හා ජින් වර්ගයන් එකතුවී (උත්සාහ කළද,) ඔවුන්ගෙන් පරිසක් තවත් පිරිසකට සහයෝගය කළද, ඔවුන්ට මෙවැන්නක් ගෙන ඒමට නොහැක. (17:86) එතුමා උම්මී (ලියවීමට හා කියවීමට නොදන්නා) වශයෙන් සිටිම කුර්ආනය එතුමා ලියූ හෝ එතුමා ඉගෙන ගත් හෝ එතුමා පැරණි ග්‍රන්ථයන් මගින් උපුටාගත් එකක් බව පවසන නින්දා අපහාස කරන්නන්ගේ වැයමට මුඛවාඩම් බිදීමක් වශයෙන් පැවැතිය.

## නබි තුමාගේ අශ්චර්යයන්

නියතවශයෙන්ම (නබිතමාට පහළවූ ) අල්කුර්ආනය ශ්‍රෙෂ්ඨම ආශ්චර්යයෙකි. මෙහි භාෂා ශෛල්‍ය එවැන්නක් නිර්මාණය කිරීම අතින් පණ්ඩිතයන් පවා අසමත් කළේය. මෙම කුර්ආනයේ ඇති පරිදි පරිච්ඡේදයන් දහයක් හෝ එක් පරිච්ඡේදයක් හෝ එක් වැකියක් හෝ ගෙනෙන ලෙස අල් කුර්ආනය

අභියෝග කළේය. නමුත් මුෂ්රික්වරුන් එම අභියෝගයට මුහුණ දීමට නොහැකිවූහ.

මුෂ්රික්වරුන් එතුමාගෙන් මේ සියල්ල මජ්පු කිරීමේ සාධකයන් පෙන්වන ලෙස ඉල්ලා සිටියහ. එබැවින් මවුන්ට එතුමා චන්ද්‍රයා පළා පෙන්නුවේය. එය කොටස් දෙකක් වන සේ පැළීය. එතුමාගේ ඇඟිලි අතර සිට අධික අවස්ථාවන්හිදී ජලය ඉතිරීය. තම අතෙහි තිබූ ගලක් තස්බීහ් (අල්ලාහ් ප්‍රශංසා) කළේය. පසු එය අබූබක්ර් (රලි) ගේ අතේද, පසු උමර් (රල්) ගේ අතේද, පසු උස්මාන් (රලි) ගේ අතේ ද එතුමා තැබිය. එවිටද එය තස්බීහ් කළේය.

නබිතුමා අනුභව කරන අවස්ථාවේ එතුමාගේ ආහාරයන් තස්බීහ් කිරීම මිනිසුන් දිටීහ. නබිත්වයට පසු සමහර රාත්‍රියන් ගල් හා ගස් යනාදියන් එතුමාට සලාම් (ආශිර් වාද) කීහ. විටකදී එතුමා මැරීම සඳහා යහුදි කාන්තාවක් නැගි කළ වස තැවරූ එළු මස් තඑතුමා සමග කථා

කළේය. එක් අරාබිවරයෙක් තමාට සාධකයක්පෙන්වන මෙන් ඉල්ලා සිටයේය.එනිසා නබිතුමා ගලකට අණ කළේය එය පැමිණිය.නැවත අණ කළේය. එය ආපසු තම ස්ථානයට ගියේය. කිරි නැති එළුවෙකුගේ කිරි බුරුල්ල එතුමා අතින් පිරිමැද්දිය. එහි කිරි ඉතිරෙන්නට විය. එයින් නබිතුමා කිරි දොවා තමා පානය කර, අබූබක්ර් (රලි) තුමාටද,පානය කිරීමට දුන්නේය. අලි බින් අබීතාලිබ් (රලි) තුමාගේ ඇස් දෙක රෝගයට පත්වූ විට නබිතුමා තම කෙළ ඔහුගේ ඇස්හි පිරිමැද්දිය. එවිගසම එය සුව විය. එක් සහාබිවරයෙකුගේ (අනුගාමිකයා) කකුලෙහි තුවාලයක් සිදුවිය. නබිතුමා එම ස්ථානය පිරිමැද්දිය. එවිගසම එය සුව විය.

නබිතුමා අනස් බින් මාලික් (රලි) තුමාට දීර්ගායුෂය, අධික සම්පත්, අධික අරුවත් හා පොහොසත්කම (බරකත්) ලබාදෙන ලෙස ප්‍රාර්ථනා කළේය. ඔහුට දරුවන් 120 දෙනෙක් ඉපදිය.

මහුගේ රටඉඳි ගස්හි වසරකට දෙවතාවක් ගෙඩි හැදෙන්නට විය. රටඉඳි ගස්හි පොදුවේ වසරකට එක් වතාවක් පමණක් ගෙඩි හැදිම සිරිතකි. මහු වසර 120ක කාලයක් ජීවත්විය. නබිතුමා දිනක් මිම්බර් හෙවත් දේශනා මණ්ඩපයට පැමිණි අවස්ථාවේ මිනිසුන් එවිට පැවැති සාගතය පිළිබඳව එතුමාට පැමිණිලි කළහ. නබි තුමා අල්ලාහ් වෙත ප්‍රාර්ථනා කළේය. එවිට අහසේ වලාකුළු නොතිබින. වහාම කඳු සේ වලාකුළු හටගෙන ර්ලග ජුම්ආ දිනය සිකුරාදා දක්වා තද වර්ෂාවක් වැස්සේය. (නැවත මවුන් ) අධික වැස්ස පිළිබඳව නබිතුමාට පැමිණිලි කළහ. එතුමා අල්ලාහ් වෙත ප්‍රාර්ථනා කළේය. වැස්ස නැවතිනි. මවුන් ඉර උෂ්ණයෙහි ඇවිදමින් පිටත්වූහ.

නබි මුහම්මදු (සල්) තුමා කන්දක් (යුද්ධයට සහභාගිවූ) වැසියන් දහස් දෙනාට තිරිඟු පිටි 'සාඅකින් හෙවත් සාමානයයෙන් කිලෝ දෙහමාරක ප්‍රමාණයක් හා එක් එළුවෙකුගෙන් සමන්විත අහාරයක් දනට දුන්හ. මවුන් කුස පිරෙන්නට

අනුභව කරමින් පිටත්වූහ. නමුත් එම ආහාරය සුළුවෙන් හෝ නොඅඩුවිය. මෙසේම නබිතුමා බෂීර් බින් සාද් (රලි) ගේ දියණිය තම පියාට හා මාමාට ගෙන ආ ස්වල්ප රට ඉඳියෙන් කන්දක් වැසියන්ට ආහාරය සැපයීය. තවද, අබූ හුරෙරා (රලි) තුමාගේ කෑම පාර්සලයෙන් සෙනවියන්ට කුස පිරෙන තෙක් ආහාර සැපයීය. නබි (සල්) තුමා මරා දැමීම සඳහා බලාපොරොත්තුවෙන් සිටි කුරෙෂිවරුන් එකසිය 100 දෙනා ඉදිරියේ මවුනගේ මුහුණු මත පස් ඉසිමින් පිටත්ව ගියේය. එවුහු එතුමාව නොදිටීහ. තවද, නබිතුමා මරා දැමීම සඳහා සුරාකා බින් මාලික් එතුමා පසු පස්සෙන් ලුහු බැඳමින් ගියේය. නබිතුමාව ළගාවූ විට එතුමා ඔහුට විරුද්ධව ප්‍රාර්ථනා කළේය. වහාම ඔහුගේ අශ්වයාගේ කකුල් පොළොවෙහි එරෙන්නට විය.

وصلى الله على نبينا محمد وعلى آله وصحبه وسلم

□والحمد لله رب العالمين